**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

## නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර - 2019

# සාගර නීතිය

**පැය තුනයි (3)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07**

**ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න**

**(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ)**

---

1. "1982 එක්සත් ජාතීන්ගේ සාගර සම්මුතිය අසම්පූර්ණ ලේඛනයක් වූ අතර වැදගත් ගැටළු බොහොමයක් අපැහැදිළිව හෝ අනීරණාත්මකව හෝ ඉතිරිකොට තිබුණි. මෙම සම්මුතිය ආර්ථික සංවර්ධනය සහ සාමය සඳහා වූ අවස්ථාවක් අහිමිකරගැනීමක් ලෙස හැඳින්විය හැක. තවද, ඉදිරියට ලෝක යුද්ධයක් ඇතිවුවහොත්, එය බොහෝ විට සාගරය පාලනය කිරීම සහ සාගර සම්පත් සම්බන්ධයෙන් හටගන්නා සටනක් වේ යැයි අනුමානය කිරීමට හැක."

   මෑතකදී ප්‍රසිද්ධ දේශපාලනඥයෙකු විසින් ඉහත ප්‍රකාශය කර ඇත. එයට විවේචනාත්මක පිළිතුරක් ලෙස, ඔබේ විෂය දැනුම පෙන්නුම් කරමින්, කෙටි ලිපියක් සකස් කරන්න.

2. ලුම්නා රාජ්‍යය තම බටහිර වෙරළාසන්න මුහුදේ කෘත්‍රිම දූපත් සමූහයක් තනමින් සිටින අතර, තම මුහුදු තීර සම්බන්ධ නීතිය ප්‍රතිශෝධනය කරමින්ද සිටී. *'දේශීය ජල තීරය සහ විශේෂ ආර්ථික කලාපය'* නම් කෙටුම්පත, ප්‍රධාන වශයෙන් පහත සඳහන් වගන්ති, දැනට පාර්ලිමේන්තුවේ විවාදයට ගෙන ඇත:

   A. 6 වගන්තියට අනුව ලුම්නාවේ දේශීය ජල තීරයේ පළල මැනීම සඳහා "ඍජු පාද රේඛා" (straight baselines) යොදා ගනී.

   B. 15 වගන්තියට අනුව ලුම්නාවේ ස්වභාවික සහ කෘත්‍රිම දූපත්වලට තමන්ටම හිමි විශේෂ ආර්ථික කලාපයක් සහ මහාද්වීපික තටකයක් ලැබේ.

   C. 18 වගන්තිය මගින් ලුම්නාවේ දේශීය ජල තීරය සහ විශේෂ ආර්ථික කලාපය තුළ ලුම්නාවේ දේශිය නීතිය කඩකිරීමක් වුවහොත් එම යාත්‍රාවන්, අවශ්‍ය නම් මහ මුහුදට හෝ වෙනත් රාජ්‍යයන්හි දේශිය මුහුදු තීරයන්ට හෝ ලුහුබැඳ අත්අඩංගුවට ගැනීමට බලධාරීන්ට අයිතිය පවරා ඇත.

   D. 25 වගන්තියට අනුව තම විශේෂ ආර්ථික කලාපයට ඉහලින් නාවික සැතපුම් 200ක් දක්වා විශේෂිත ගුවන් අවකාශයකට හිමිකම් කියා ඇත.

   ලුම්නා විසින් 1982 එක්සත් ජාතීන්ගේ සාගර සම්මුතිය අපරානුමත කර ඇතැයි උපකල්පනය කරන්න. ඉහත දක්වා ඇති කෙටුම්පතේ වගන්ති අන්තර්ජාතික නීතියේ ප්‍රමිතීන්ට අනුකූලවේදැයි සාකච්ඡා කරන්න.

3. කෝලා නම් විශාල මුහුදු බොක්කේ එකිනෙකට යාබදව පිහිටා ඇති, 1982 එක්සත් ජාතීන්ගේ සාගර සම්මුතිය අපරානුමත කර ඇති, වෙරළබඩ රාජ්‍යයන් දෙකක් ලෙස දේශිනී සහ සාලාලැන්ඩ් හැඳින්විය හැකිය. මෑතකදී සාලාලැන්ඩ් විසින් තම පාද රේඛා සිට නාවික සැතපුම් 500ක් දක්වා

කෝලා බොක්කට විහිදෙන මහාද්වීපික තටක ප්‍රදේශයකට හිමිකම් කියා ඇත. සාලාලැන්ඩ් විසින් කර ඇති මෙම මහාද්වීපික තටක හිමිකම් කීමට එරෙහිව දේශිනී විසින් විරුද්ධත්වය ප්‍රකාශකර ඇති අතර, 1982 සම්මුතියේ වගන්ති වලට අනුකූල නොවී දේශිනීට අයත් මහාද්වීපික තටක ප්‍රදේශයක් සාලාලැන්ඩ් පවරා ගෙන ඇති බවත් දේශිනී කියා සිටී. මෙම ප්‍රශ්නය අන්තර්ජාතික යුක්ති අධිකරණයට ගෙන යාමට දේශිනී බලාපොරොත්තු වෙයි.

සාලාලැන්ඩ් කියා සිටින්නේ මෙවැනි විශාල මහාද්වීපික තටක ප්‍රදේශයකට නීත්‍යානුකූලව හිමිකම් කීමට අවස්ථාවක් සම්මුතිය මඟින්ම සලසා දී ඇති බවත්, කෙසේ නමුත් තමන්ට කෝලා බොක්ක සම්බන්ධයෙන් 'ඓතිහාසික අයිතීන්' (‘historic rights’) තිබෙන බවත්, එවැනි අයිතීන්ද සම්මුතියෙන් හඳුනාගෙන ඇති බවත් ය. තවද, අන්තර්ජාතික යුක්ති අධිකරණයට එම ගැටළුව සම්බන්ධයෙන් අධිකරණ බලයක් නොමැති බව සාලාලැන්ඩ් දරණ මතය වේ.

සාලාලැන්ඩ් හි තර්ක වලට ඔබ එකඟ වනවාද? 1982 එක්සත් ජාතීන්ගේ සාගර සම්මුතියේ වගන්ති සහ අදාළ නඩු තීරණ ආශ්‍රයෙන් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

4. පහත සඳහන් තත්වයන් සම්බන්ධයෙන් රාජ්‍යයන්ගේ අයිතීන් සහ වගකීම් සාකච්ඡා කරන්න. සියළු රාජ්‍යයන් 1982 එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය අපරානුමත කර ඇතැයි උපකල්පනය කරන්න.
   A. වීටා නම් රාජ්‍යය සහ ලියොනියා නම් රාජ්‍යය, සවන්නා සාගරයේ ඇති වෙරළබඩ රාජ්‍යයයන් වේ. තල්මසුන් පිළිබඳ පරීක්ෂණ කරමින් සහ මිනුම් ගනිමින් සිටි ලියොනියා කොඩිය දරාගත්, නැවක් විසින් තම දේශීය ජල තීරයට අවසර නොමැතිව පැමිණ ඇති බවත්, මුහුදු පතුලේ තිබූ කේබල් වලට බරපතල හානි කර ඇති බවත් වීටා කියා සිටී. එම ලියොනියා නැව විසින් වීටා විශේෂ ආර්ථික කලාපයේ ගිලුනු නැවක සුන්බුන් අතර තිබූ වටිනා පුරාවස්තු ඉවත් කර ඇතැයි සැකයක්ද පවතී.
   B. මෝර්ඩැනියා සහ ලැසිලැන්ඩ් යනු ෆ්ලොසියා සාගරයේ පිහිටි වෙරළබඩ රාජ්‍යයන් දෙකක් ය. මෝර්ඩැනියා විසින් ක්‍රියාත්මක කරන ‘නීමෝ ව්‍යාපෘතිය’ යනු දේශගුණික වෙනස්වීම් සහ බරපතල කාලගුණ තත්වයන් සම්බන්ධයෙන් ෆ්ලොසියා සාගරයේ නිදහසේ පාවෙන සාගර අධීක්ෂණ උපාංගයන් 3000ක් තැන්පත් කරන ව්‍යාපෘතිය කි. මෙම උපාංග තමන්ගේ මුහුදු ප්‍රදේශ තුළට පාවී පැමිණ, විශේෂ ආර්ථික කලාපයේ සහ මහද්වීපික තටක ප්‍රදේශයේ තම ජාතික ආරක්ෂාව සහ ජාතික සම්පත් පිළිබඳ වැදගත් තොරතුරු එකතු කරගැනීමට ඉඩ ඇතැයි ලැසිලැන්ඩ් සැළකිලිමත්ව සිටින අතර, එම ව්‍යාපෘතිය මේ නිසා නතර කර යුතුයි යන ස්ථාවරයේ සිටී.

5. පහත සඳහන් ප්‍රකාශවලට ඔබ එකඟ වනවාද? අදාළ අන්තර්ජාතික නීති සිද්ධාන්ත ආශ්‍රයෙන් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
   A. “සාගරයේ හමුදා කටයුතු සම්බන්ධයෙන් ඇති මතභේදයන්ට තුඩුදී ඇත්තේ එම කටයුතු *‘තරණයේ නිදහස’ (‘freedom of navigation’) සහ ගුවන් ගමන් අයිතීන් (overflight) ද, සාගරය පරිහරණය කිරීම සම්බන්ධයෙන් ඇති එම නිදහස් හා යා වූ අනෙකුත් අන්තර්ජාතික වශයෙන් නීත්‍යානුකූල භාවිතාවන්’’* වලට එම කටයුතු අයත් වේදැයි යන ප්‍රශ්නයයි.”
   B. “යම් අපරාධයක් කරමින් සිටින බවට සාධාරණ සැකයක් ඇත් නම් යුද නැවක නාවිකයන්ට මහ මුහුදේ දී හමුවූ යම් විදේශ නැවකට ගොඩ විය හැකිය.”

6. “සාගරයට ඉතා විශාල ජෛව විවිධත්ව සම්පත් ඇති අතර එය අන්තර්සම්බන්ධ ගෝලීය පරිසර පද්ධතිය තුල අත්‍යාවශ්‍ය කාර්යපටිපාටියක් ඉෂ්ට කරන බව පිළිගෙන ඇත. එනමුත් සාගර පරිසරය අසම්පූර්ණ වූ ආයතන සහ සම්මුතීන් ගණනාවක් මඟින් ඉතාම දුර්වල ලෙස පාලනය වන අතර 1982 එක්සත් ජාතීන්ගේ සාගර සම්මුතිය මඟින් ලබා දී ඇත්තේ පරිසර සංරක්ෂණයේ ප්‍රතිපත්තීන් පිළිබඳ අවම මඟ පෙන්වීමක් පමණයි.”

   ඉහත ප්‍රකාශය නූතන අන්තර්ජාතික නීතීන් සහ සාගර පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ තිබෙන මූලික ප්‍රතිපත්තීන් ආශ්‍රයෙන් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

7. “1982 එක්සත් ජාතීන්ගේ සාගර සම්මුතිය මඟින් සාගර පතුලේ ගවේෂණයේ සහ සම්පත් පරිහරණයේ ප්‍රතිලාභ සියළු මිනිස් සංහතියටම ලැබෙන බව තහවුරු කළ යුතු යැයි එම සම්මේළනයට එම සම්මේලනයට සහභාගී වූ රාජ්‍යයන් වැඩි දෙනෙක්ගේ අදහස විය. එම අපේක්ෂාව ජය ගත හැකි එකක් නොවන බව රාජ්‍යයන් විසින් පිළිගත යුතු කාලය දැන් එළඹ ඇත.”

සාගර පතුල ප්‍රදේශය (sea bed area) සම්බන්ධ 1982 එක්සත් ජාතීන්ගේ සාගර සම්මුතිය මඟින් අන්තර්ගත කර ඇති අන්තර්ජාතික නීතිමය සහ ආයතනික රාමුව ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව පරික්ෂා කරන්න.